*සියලු ම හිමිකම් ඇවිරිණි*
*All Rights Reserved*

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය
Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone

**ගම්පහ අධ්‍යාපන කලාපය**
**Gampaha Education Zone**

දෙවන වාර ඇගයීම - 2025
Second Term Evaluation - 2025

| | | | | | |
|---|---|---|---|---|---|
| ශ්‍රේණිය Grade | 12 | විෂයය Subject | ආර්ථික විද්‍යාව II | කාලය Time | පැය 03 |

**(''අ'' උප කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද, ''ආ'' උප කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.)**

**('අ' කොටස)**

**01.**
1. ''සියළුම නිෂ්පාදන සාධක ආර්ථික සම්පත් වේ.'' මෙම ප්‍රකාශය සමග ඔබ එකඟ වන්නේද? පැහැදිලි කරන්න. (ලකුණු 06)
2. ආවස්ථික පිරිවැය ශුන්‍ය වන අවස්ථා 03 ක් සඳහන් කරන්න. (ලකුණු 03)
3. ස්වභාවික සම්පත් වර්ගීකරණය කර උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 05)
4. ශ්‍රම විභජනය සහ විශේෂීකරණය නිෂ්පාදන ක්‍රියාවලියේ ඵලදායිතාවය සඳහා ඉවහල්වන ආකාරය විස්තර කරන්න. (ලකුණු 06)

**02.**
1. ''මිල හා ඉල්ලුම් ප්‍රමාණය අතර ප්‍රතිලෝම සම්බන්ධතාවයක් පවතී.'' මෙම ප්‍රකාශය අභිමතානුරූපී ප්‍රකාශයක් ද, නැතහොත් යථානුරූපී ප්‍රකාශයක් ද ? ඔබේ පිළිතුරට හේතු ඉදිරිපත් කරන්න. (ලකුණු 04)
2. ආර්ථික පද්ධතියක් යන්නෙන් කුමක් අදහස් කරයි ද ? ආර්ථික පද්ධති අතර වෙනස්කම් දක්නට ලැබෙන්නේ කුමන කරුණු නිසාද ? (ලකුණු 04)
3. වර්තමානයේ ''සමාජවාදී වෙළඳපොළ'' ආර්ථික පද්ධතිය යන්නෙන් හඳුන්වන්නේ කුමක්ද ? එවැනි ආර්ථික පද්ධති සඳහා නිදසුන් 2 ක් දෙන්න. (ලකුණු 04)
4. විධාන ආර්ථික පද්ධතියක් හා වෙළෙඳපොල ආර්ථික පද්ධතියක් අතර දක්නට ඇති සමානකම් දෙකක් හා අසමානකම් දෙකක් ඉදිරිපත් කරන්න. (ලකුණු 04)
5. ''සම්පත් කාර්යක්ෂමව බෙදා හැරීමට මිල යාන්ත්‍රණය අසමත් වේ.'' මෙම ප්‍රකාශය සමග ඔබ එකඟ වන්නේද ? හේතු ඉදිරිපත් කරන්න. (ලකුණු 04)

**03.**
1. නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් ඇඳීමේදී භාවිතා කරන උපකල්පන සඳහන් කරන්න. (ලකුණු 04)
2. ''වැඩිවන ආවස්ථික පිරිවැය නීතිය'' යන්න හඳුන්වා එවැනි තත්ත්වයක් ඇතිවීමට බලපාන හේතු පෙන්වා දෙන්න. (ලකුණු 04)
3. ආර්ථික පසුබැස්ම හා ආර්ථික අවපාතය තත්වයක් නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර භාවිතයෙන් පැහැදිලි කරන්න. මෙම අවස්ථාවලදී ආර්ථිකයක දැකිය හැකි ලක්ෂණ පෙන්වා දෙන්න. (ලකුණු 08)
4. නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් භාවිතයෙන් පහත සඳහන් සිද්ධීන් පැහැදිලි කරන්න.
   - i. විශේෂඥ වෛද්‍යවරු බොහෝ පිරිසක් රට අතහැර විදේශ රටවල් වල සේවය සඳහා පිටත්ව යාම.
   - ii. ප්‍රවාහන සේවා ප්‍රවර්ධන කිරීම සඳහා බස්, ගුවන් යානා හා දුම්රිය වැනි ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම. (ලකුණු 04)

**('ආ' කොටස)**

**04.**
1. භාණ්ඩයක මිල පහල යන විට පාරිභෝගිකයන් එම භාණ්ඩය වැඩියෙන් ඉල්ලුම් කරන්නේ ඇයි ? (ලකුණු 04)
2. ''මිල ප්‍රතිවිපාකය'' යන්න හඳුන්වා බාල භාණ්ඩයක මිල පහළ යාමේදී මිල ප්‍රතිවිපාකය ක්‍රියාත්මක වන ආකාරය රූප සටහන් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

3. සළාකනය සඳහා යොදා ගැනෙන මිල නොවන මාධ්‍යයන් මොනවාද ? (ලකුණු 04)

4. නිදහස් තරඟකාරි වෙළෙඳපොළක ඉල්ලුම් ශ්‍රිතය Qd = 100-2P වන අතර පූර්ණ නම්‍ය සැපයුමක් පවතී. වෙළෙඳපොල සමතුලිත ප්‍රමාණය ඒකක 50 කි.

i. සමතුලිතය ප්‍රස්තාරයේ පෙන්වා සමතුලිතයේ දී ආර්ථික අතිරික්තය ගණනය කරන්න. (ලකුණු 04)

ii. රජය නිෂ්පාදකයින්ට රු.10/- ඒකක බද්දක් පැනවුවහොත් බද්දෙන් පසු මුළු ආර්ථික අතිරික්තය හා අහිමි වන ශුභ සාධනය ගණනය කරන්න. (ලකුණු 04)

**05.** 1. සැපයුම නීතිය යන්න නිර්වචනය කොට සැපයුම කෙරෙහි බලපාන මිල නොවන සාධක සඳහන් කරන්න. (ලකුණු 04)

2. තරගකාරී වෙළෙඳපොලක අලෙවිවන එක්තරා භාණ්ඩයක් සම්බන්ධ ඉල්ලුම් හා සැපයුම් ශ්‍රිත පහත දැක්වේ.

Qd = 14 - P

Qs = -2 + P

i. සමතුලිත මිල හා සමතුලිත ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 02)

ii. සමතුලිත මිලේදී ඉල්ලුම් නම්‍යතාව හා ව්‍යාපාරික අයභාරය ගණනය කරන්න. (ලකුණු 02)

iii. මෙම භාණ්ඩ විකිණිය හැකි උපරිම මිල රු.5/- ක් ලෙස රජය තීරණය කළේ නම් වෙළෙඳපලෙහි ඇතිවිය හැකි ප්‍රතිවිපාක 02 ක් සඳහන් කරන්න. (ලකුණු 02)

3. පහත දැක්වෙන්නේ එක්තරා භාණ්ඩයකට අදාල ඉල්ලුම් හා සැපයුම් සමීකරණ වේ.

Qd = 1000-20P

Qs = -200+20P

i. වෙළෙඳපොළ සමතුලිත මිල හා සමතුලිත ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 02)

ii. රජය මෙම භාණ්ඩය සඳහා ඒකකකයක් මත රු.20/- ක නිෂ්පාදන සහනාධාරයක් ලබා දුන්නේ නම් සහනාධාරයෙන් පසු පාරිභෝගික අතිරික්තය හා නිෂ්පාදන අතිරික්තය ගණනය කරන්න. (ලකුණු 04)

iii. සහනාධාරය සඳහා රජයේ පිරිවැය ගණනය කරන්න. (ලකුණු 02)

iv. සහනාධාරය ලබාදීම නිසා ඇතිවන අහිමිවන සුභසාධනය ගණනය කරන්න.(ලකුණු 02)

**06.** 1. ඉල්ලුම් වක්‍රයක් මත සෑම ලක්ෂයකම එක සමාන නම්‍යතා සංගුණකයන් පෙන්නුම් කරන සුවිශේෂී අවස්ථා පෙන්වා දෙන්න. (ලකුණු 03)

2. ආදායම් වියදම් නම්‍යතාව යන්නෙන් කුමක් අදහස් කෙරේද ? මෙම නම්‍යතාවයේ ඇති ප්‍රායෝගික වැදගත්කම කවරේද ? (ලකුණු 04)

3. පහත දැක්වෙන්නේ කිසියම් භාණ්ඩයක වෙළෙඳපොළ ඉල්ලුම් සැපයුම් සමීකරණ දෙකකි.

Qd = 2-5P

Qs = -50+5P

i. රජය මෙම භාණ්ඩය මත රු.35/- ක සහතික මිලක් පනවා අතිරික්ත සැපයුම් මිලදී ගත්තේ නම් පාරිභෝගික අතිරික්තය හා නිෂ්පාදන අතිරික්තය ගණනය කරන්න. (ලකුණු 05)

ii. මේ සඳහා රජයට දැරීමට සිදුවන පිරිවැය කොපමණද ? (ලකුණු 02)

iii. රජයේ මෙම මැදිහත්වීම නිසා සමාජයට අහිමිවන සුභසාධනයේ ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 02)

4. වෙළෙඳපොලෙහි කාර්මික භාණ්ඩවලට වඩා කෘෂිකාර්මික නිෂ්පාදිත වල මිල ගණන් උච්ඡාවචනය වන්නේ ඇයි ? මෙම තත්වය වලක්වා ගැනීමට මිල ස්ථායිකරණය සඳහා රජයට ගත හැකි ක්‍රියාමාර්ග මොනවාද ? (ලකුණු 04)

**07.** 1. නිෂ්පාදනයේ කෙටි කාලය හා දිගු කාලය අතර වෙනස නිෂ්පාදන ශ්‍රිතයක් ඇසුරෙන් පෙන්වා දෙන්න. (ලකුණු 04)

2. ''හීනවන ඵලදා න්‍යාය''යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද ? යන්න පැහැදිලි කර සාමාන්‍ය ඵලදා වක්‍රය හා ආන්තික ඵලදා වක්‍රයේ හැසිරීම පෙන්වා දෙන්න. (ලකුණු 04)

3. ''වැඩිවන පරිමාණානුකූල ඵල'' යන්න පැහැදිලි කර මහා පරිමාණ පිරිමැසුම් හටගැනීමෙහි ලා බලපාන සාධක පෙන්වා දෙන්න. (ලකුණු 04)

4. ආර්ථික ලාභය හා ගණකාධිකරණ ලාභය අතර වෙනස පෙන්වා දෙන්න. (ලකුණු 04)

5. ගිළුණු පිරිවැය යන්න හඳුන්වා ඒ සඳහා නිදසුන් 2 ක් ඉදිරිපත් කරන්න. (ලකුණු 04)